## ප්‍රවෘත්ති නිවේදනය
## PRESS RELEASE

සෞඛ්‍ය අමාත්‍යාංශය | சுகாதார அமைச்சு | Ministry of Health

Telephone Office: 2671181 / Gen: 2694033 / 2669192 / 2675011 / 2675449 / Fax: 2689540

2024.11.23

| 11 | 12 |
|---|---|

ප්‍රවෘත්ති අධ්‍යක්ෂ / ප්‍රවෘත්ති කර්තෘ /ප්‍රවෘත්ති සංස්කාරක,

පහත සඳහන් ප්‍රවෘත්තියට ඔබ මාධ්‍ය මගින් පුලුල් ප්‍රචාරයක් ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි .

---

### මාධ්‍ය නිවේදනයයි.

### සෞඛ්‍ය අමාත්‍යතුමාගේ මහනුවර චාරිකාව - සාවද්‍ය ප්‍රවෘත්තිය නිවැරදි කිරීම.

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍ය වෛද්‍ය නලින්ද ජයතිස්ස මහතා මහනුවර රජයේ රෝහලක නිරීක්ෂණ චාරිකාවක නිරත වූ බවත් එහිදී යම් යම් පරීක්ෂා කිරීම් සහ අඩුපාඩු පෙන්වා දීම් සිදුකල බවත් ඉතා දීර්ඝ ලෙස කරුණු දක්වමින් සිංහල සහ ඉංග්‍රීසි භාෂා ද්විත්වයෙන් සමාජ මාධ්‍ය ඔස්සේ ප්‍රවෘත්තියක් හුවමාරු වන බව නිරීක්ෂණය වී ඇත.

එම සාවද්‍ය ප්‍රවෘත්තියේ සඳහන් පරිදි සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍ය වෛද්‍ය නලින්ද ජයතිස්ස මහතා එම ධූරයට පත්වූ පසු මේ දක්වා මහනුවර හෝ දිවයිනේ වෙනත් කිසිදු ප්‍රදේශයක රෝහල් නිරීක්ෂණයකට සහභාගි වී නොමැති බව අවධාරණයෙන් සඳහන් කරමි.

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍ය වෛද්‍ය නලින්ද ජයතිස්ස මහතා ඊයේ පෙරවරු 9.00 සිට රාත්‍රී 8.00 පමන දක්වා කොළඹ 10 පිහිටි සෞඛ්‍ය අමාත්‍යාංශයේ රැඳී සිටි අතර ඒ මහතාට පරිශ්‍රයෙන් බැහැරව යාමට අවස්ථාවක් නොතිබිණි.

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍ය වෛද්‍ය නලින්ද ජයතිස්ස මහතා ඊයේ උදෑසන සිට පස්වරුව දක්වා සෞඛ්‍ය සේවා ක්ෂේත්‍රයේ ප්‍රධාන වෘත්තීය සමිති 07ක නියෝජිතයන් සහ අමාත්‍යාංශයේ නිලධාරීන් සමග සෞඛ්‍ය වෘත්තිකයන්ගේ වෘත්තීය හා සේවා ගැටලු පිළිබඳවත් විශේෂයෙන්ම සෞඛ්‍ය සේවාව නගා සිටුවීමේ ඉදිරි සැළසුම් සකස් කිරීම පිළිබඳවත් එම නියෝජිතයන් සමග දීර්ඝ වශයෙන් අදහස් හුවමාරු කර ගැනීමක් සිදුකරන ලදී.

එවන් තත්ත්වයක් යටතේ ඊයේ (22) ගරු අමාත්‍යතුමාට මහනුවර හෝ දිවයිනේ වෙනත් කිසිදු ප්‍රදේශයක රෝහල් නිරීක්ෂණය කිරීමට යාමට අවකාශ නොතිබූ බව නැවත අවධාරණය කරමි.

මෙවන් සාවද්‍ය ප්‍රවෘත්ති පලකිරීම් මගින් සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නිලධාරීන් හා ආයතන අපහසුතාවයට පත් නොකරන ලෙසත් එවන් සාවද්‍ය ප්‍රවෘත්ති සමාජ මාධ්‍ය ඔස්සේ ප්‍රචාරය කර මහජනතාව නොමග යැවීම සිදු නොකරන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමි.

දීප්ති විජේතුංග
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගේ මාධ්‍ය ලේකම්
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.